# මාධ්‍ය නිවේදනය


සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | **2024 ජූනි 28** |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය
## 2024 මැයි

2024 වසරේ මැයි මාසයේ දී **වෙළඳ හිඟය අඩු වීම, සේවා අංශය වෙත වූ ලැබීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යාම** මගින් විදේශ අංශයට සහාය විය.

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

**2024 මැයි:**

එ.ජ.ඩො. මිලියන **544**



11.8 % ජන. - මැයි

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ,** 2023 වසරේ ජනවාරි-මැයි කාලපරිච්ඡේදය තුළ දී වූ එ.ජ.ඩො. මිලියන **2,347**ට සාපේක්ෂව 2024 වසරේ ජනවාරි-මැයි කාලපරිච්ඡේදය තුළ දී එ.ජ.ඩො. මිලියන **2,624**ක් විය.

## දළ නිල සංචිත*




** චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වේ.*

**දළ නිල සංචිත** 2023 වසර අවසානයට සාපේක්ෂව එ.ජ.ඩො. බිලියන 1කට වඩා වැඩිවීමක් වාර්තා කරමින් 2024 වසරේ මැයි මාසය අවසාන වන විට එ.ජ.ඩො. බිලියන **5.4**ක් විය.

## භාණ්ඩ වෙළඳාමේ ක්‍රියාකාරිත්වය

**මැයි 2024** | **2024 ජන. - මැයි**




වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය, වාර්ෂික ලක්ෂමය පදනම මත, 2024 වසරේ මැයි මාසයේ දී අඩු වූ 2024 ජනවාරි-මැයි කලපරිච්චයේ දී ඉහළ ගියේය.

## සංචාරක ඉපැයීම්

2024 වසරේ ජනවාරි-මැයි කාලපරිච්ඡේදය තුළ දී **සංචාරක ඉපැයීම්** එ.ජ.ඩො. මිලියන **1,406**ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, 2023 වසරේ ජනවාරි-මැයි කාලපරිච්ඡේදය තුළ දී එ.ජ.ඩො. මිලියන **752**ක් ලෙස වාර්තා විය.




## විනිමය අනුපාතිකය







**එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල,** 2024 වසරේ මැයි මාසය දක්වා අතිප්‍රමාණය විය.

## සේවා අංශය වෙත වූ ලැබීම්
(සංචාරක ඉපැයීම් හැර)




**සේවා අංශය වෙත වූ ලැබීම්** 2023 වසරේ මැයි මාසයේ දී වූ එ.ජ.ඩො. මිලියන **265**ට සාපේක්ෂව 2024 වසරේ මැයි මාසයේ දී එ.ජ.ඩො. මිලියන **306**ක් විය.

## රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ (ශුද්ධ)

2024 වසරේ මැයි මාසයේ දී **රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශ ආයෝජන** ශුද්ධ ගෙවීම් අඛණ්ඩව වාර්තා විය.




2024 මැයි
**ලැබීම්:** එ.ජ.ඩො. මිලියන **18**
**ගෙවීම්:** එ.ජ.ඩො. මිලියන **65**

2024 ජන. - මැයි
**ලැබීම්:** එ.ජ.ඩො. මිලියන **203**
**ගෙවීම්:** එ.ජ.ඩො. මිලියන **362**

## කොළඹ කොටස් වෙළඳපොළ (ශුද්ධ)




**කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ලැබීම්** 2024 වසරේ මැයි මාසයේ දී සුළු ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

## වෙළඳ භාණ්ඩ ගිණුමේ ශේෂය

වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය 2023 වසරේ මැයි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 447ක සිට 2024 වසරේ මැයි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 393ක් දක්වා පහළ ගිය අතර ඒ සඳහා අපනයන ආදායම පහළ යෑමට වඩා වැඩි වේගයකින් ආනයන වියදම පහළ යෑම හේතු විය. මීට සමානව, 2024 වසරේ මැයි මාසයේ වෙළඳ හිඟය 2024 වසරේ අප්‍රේල් මාසයේ වෙළඳ හිඟය වූ එ.ජ. ඩොලර් මිලියන 558ට සාපේක්ෂවද පහළ ගියේය. මේ අතර 2024 වසරේ ජනවාරි සිට මැයි දක්වා කාලපරිච්ඡේදය තුළ වෙළඳ ගිණුමේ සමස්ත හිඟය 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,926ක හිඟයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,170ක හිඟයක් දක්වා පුළුල් විය.

**රූප සටහන 1: මාසික අපනයන ආදායම**




**රූප සටහන 2: මාසික ආනයන වියදම**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය[1]

**වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, 2023 වසරේ මැයි මාසයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,019ට සාපේක්ෂව 2024 වසරේ මැයි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 1,011ක් දක්වා සියයට 0.8කින් පහළ ගියේය.** කෘෂිකාර්මික අපනයනවල ආදායම්හි පහළ යෑමක් නිරීක්ෂණය වූ අතර කාර්මික අපනයන සහ ඛනිජ අපනයන 2024 මැයි මාසයේදී ඉහළ ගියේය.

2024 වසරේ මැයි මාසයේ දී **කාර්මික භාණ්ඩ** අපනයනයන්හි ඉහළ යෑම සඳහා නැව් සහ ගුවන් යානා ඉන්ධන අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය. 2024 වසරේ මැයි මාසයේ දී **කෘෂිකාර්මික භාණ්ඩ** අපනයන ආදායම පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් සුළු කෘෂිකාර්මික නිෂ්පාදන (මූලිකව පුවක්) සහ මුහුදු ආහාර අපනයනය පහළ යෑම දායක විය. කුළුබඩු සහ තේ අපනයන ආදායමේ ද යම් ප්‍රමාණයකට අඩුවීමක් වාර්තා විය. **ඛනිජ අපනයන** ආදායම ද 2024 වසරේ මැයි මාසයේදී ඉහළ ගියේය. මේ අතර, 2024 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2024 වසරේ මැයි මාසයේ දී අපනයන ආදායම ඉහළ ගිය අතර ඒ සඳහා පෙර මාසයට සාපේක්ෂව රෙදිපිළි හා ඇඟලුම් අපනයන ඉහල යෑම හේතු විය.

[1] වෙළඳ භාණ්ඩ සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු වර්ගීකරණය සහ සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයේ සිව්වන සංස්කරණය පදනම් කර ගත් සංයුතීන්, පිළිවෙළින්, ඇමුණුම II, ඇමුණුම III, ඇමුණුම IV සහ ඇමුණුම V හි දක්වා ඇත.

## රූප සටහන 3: අපනයන සංයුතිය

**2024 මැයි: එ.ජ. ඩො. මිලියන 1,011**
2023 මැයි: එ.ජ. ඩො. මිලියන 1,019




**2024 ජන. - මැයි: එ.ජ. ඩො. මිලියන 5,067**
2023 ජන. - මැයි : එ.ජ. ඩො. මිලියන 4,866




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය[1]

වෙළඳ භාණ්ඩ ආනයන වියදම, **2023** වසරේ මැයි මාසයේ දී වාර්තා වූ **එ.ජ. ඩොලර් මිලියන 1,466ට** සාපේක්ෂව **2024** වසරේ මැයි මාසයේ දී **එ.ජ. ඩොලර් මිලියන 1,405ක්** දක්වා **සියයට 4.2කින් පහළ ගියේය.** පාරිභෝගික සහ අන්තර් භාණ්ඩවල වියදම, ආනයන වියදම්වල මෙම පහළ යෑම සඳහා දායක වූ අතර ආයෝජන භාණ්ඩ ආනයනයේ වැඩිවීමක් වාර්තා විය.

## රූප සටහන 4: ආනයන සංයුතිය

**2024 මැයි: එ.ජ. ඩො. මිලියන 1,405**
2023 මැයි: එ.ජ. ඩො. මිලියන 1,466




**2024 ජන. - මැයි: එ.ජ. ඩො. මිලියන 7,238**
2023 ජන. - මැයි : එ.ජ. ඩො. මිලියන 6,791




**මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනයේ වැඩි වීමක් දක්නට ලැබුණද 2024 වසරේ මැයි මාසයේ **පාරිභෝගික භාණ්ඩ** ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අඩුවීම සඳහා ආහාර පාන ආනයන වියදම් (මූලික වශයෙන් සීනි සහ කිරි නිෂ්පාදිත) පුළුල් වශයෙන් අඩු වීම හේතු විය. මේ අතර, 2023 වසරේ මැයි මාසයට සාපේක්ෂව ඉන්ධන ආනයනය වියදම පහළ යෑම **අන්තර් භාණ්ඩ** ආනයන වියදම් පහළ යෑමට මූලික වශයෙන් හේතු විය. කෙසේ වුවද, තිරිඟු, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සඳහා වූ වියදම 2024 වසරේ මැයි මාසයේදී යම් ප්‍රමාණයකට ඉහළ ගියේය. **ආයෝජන භාණ්ඩ** සඳහා වූ වියදම පුළුල් වශයෙන් ඉහළ ගිය අතර යන්ත්‍රෝපකරණ ආනයන වියදම ඉහළ යෑම මූලික වශයෙන් හේතු විය. මේ අතර, 2024 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2024 වසරේ මැයි මාසයේ දී ආනයන වියදම් පහළ යෑම සඳහා ඉන්ධන වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු විය.

## වෙළඳ දර්ශක[2]

අපනයන සහ ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන **වෙළඳ මිල අනුපාතය**, 2023 වසරේ මැයි මාසයට සාපේක්ෂව 2024 වසරේ මැයි මාසයේ දී සියයට 0.3කින් වර්ධනය වූ අතර, ඒ සඳහා අපනයන මිල ගණන් පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් ආනයන මිල ගණන් පහළ යෑම හේතු විය.

2024 වසරේ මැයි මාසයේ දී අපනයන ආදායම 2023 වසරේ මැයි මාසයට සාපේක්ෂව පහළ යෑම සඳහා අපනයන මිල පහළ යෑම හේතු වූ බව නිරූපණය කරමින් අපනයන පරිමා දර්ශකය සියයට 6.8කින් ඉහළ ගිය අතර, අපනයන ඒකක මිල දර්ශකය සියයට 7.1කින් පහළ ගියේය.

එසේම, 2024 වසරේ මැයි මාසයේ දී ආනයන වියදම 2023 වසරේ මැයි මාසයට සාපේක්ෂව පහළ යෑම සඳහා ද මිල හේතු වූ බව නිරූපණය කරමින් ආනයන පරිමා දර්ශකය සියයට 3.4කින් ඉහළ ගිය අතර, ආනයන ඒකක මිල දර්ශකය සියයට 7.4කින් පහළ ගියේය.

**රූප සටහන 5: වෙළඳ මිල අනුපාතය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: අපනයන පරිමා සහ ඒකක මිල දර්ශක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: ආනයන පරිමා සහ ඒකක මිල දර්ශක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

[2] එ.ජ. ඩොලර් වටිනාකම අනුව

## සේවා අංශයේ ක්‍රියාකාරීත්වය[3]

**සංචාරක ඉපැයීම් :** 2024 වසරේ මැයි මාසයේ දී සංචාරක ඉපැයීම්, 2024 වසරේ අප්‍රේල් මාසය සඳහා ඇස්තමේන්තු කළ එ.ජ. ඩොලර් මිලියන 226ට සහ 2023 වසරේ මැයි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 100ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 154ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 8: මාසික සංචාරක ඉපැයීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: මාසික සංචාරක පැමිණීම්**




**මූලය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**සේවා අංශයේ අනෙකුත් ලැබීම්[4] :** 2024 වසරේ මැයි මාසයේ දී සේවා අංශය වෙත වූ අනෙකුත් ලැබීම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් දායක වූයේ මුහුදු ප්‍රවාහන සේවා සහ පරිගණක, තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවාවන්ය. කෙසේ වෙතත්, 2023 වසරේ මැයි මාසයට සාපේක්ෂව ඉදිකිරීම් සේවාවල සහ විදුලි සංදේශ සේවාවල අඩු වීමක් වාර්තා විය. 2024 වසරේ මැයි මාසයේ දී සේවා අංශය වෙත වූ මුළු ලැබීම් (සංචාරක ඉපැයීම් හැර) 2023 වසරේ මැයි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 265ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 306ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

**රූප සටහන 10: සේවා අංශය වෙත වූ ප්‍රධාන ලැබීම් (සංචාරක ඉපැයීම් හැර)**

**2024 මැයි: එ.ජ. ඩො. මිලියන 306**

2023 මැයි: එ.ජ. ඩො. මිලියන 265

**2024 ජන. - මැයි: එ.ජ. ඩො. මිලියන 1,468**

2023 ජන. - මැයි: එ.ජ. ඩො. මිලියන 1,314




**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

[3] ශ්‍රී ලංකා මහ බැංකුව සිය අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (ITRS) මත පදනම්ව, උප කාණ්ඩවල දත්ත ද ඇතුළත් වන පරිදි, 2024 වසරේ ජනවාරි මාසයේ සිට සේවා අංශයේ සංඛ්‍යාලේඛන මාසිකව වාර්තා කිරීම ආරම්භ කරන ලදී.

[4] තාවකාලික

**සේවා අංශයේ ගෙවීම්[4] :** 2024 වසරේ මැයි මාසයේ දී සේවා අංශය වෙතින් වූ ගෙවීම් ප්‍රධාන වශයෙන් විදේශ සංචාර, ගුවන් ප්‍රවාහනය, මුහුදු ප්‍රවාහනය, නිෂ්පාදන සේවා සහ පරිගණක, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවාවන් සම්බන්ධයෙන් වාර්තා විය. 2024 වසරේ මැයි මාසයේ දී සේවා අංශය වෙතින් වූ මුළු ගෙවීම් 2023 වසරේ මැයි මාසයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 196ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 230ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.

**රූප සටහන 11: සේවා අංශයේ ප්‍රධාන ගෙවීම්**

**2024 මැයි: එ.ජ. ඩො. මිලියන 230** **2024 ජන. - මැයි: එ.ජ. ඩො. මිලියන 1,263**

2023 මැයි: එ.ජ. ඩො. මිලියන 196 2023 ජන. - මැයි: එ.ජ. ඩො. මිලියන 944




**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

2024 වසරේ අප්‍රේල් සහ මැයි මාසවල දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 544ක් ලෙස සමාන මට්ටම්වල පැවතුනි.

**රූප සටහන 12: මාසික විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

[4] තාවකාලික

## මූල්‍ය ලැබීම්

2024 වසරේ මැයි මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි එ.ජ. ඩොලර් මිලියන 46ක විදේශ ආයෝජනවල ශුද්ධ ගෙවීමක් වාර්තා වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2024 වසරේ ජනවාරි-මැයි කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 159ක සමස්ත ශුද්ධ ගෙවීමක් වාර්තා විය. මේ අතර, ප්‍රාථමික හා ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු ඇතුළත්, කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වූ විදේශීය ලැබීම්, 2024 වසරේ ජනවාරි-මැයි කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 23ක සමස්ත ශුද්ධ ලැබීමක් වාර්තා කළ ද 2024 වසරේ මැයි මාසයේ දී සුළු ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. මෙම සමුච්චිත ශුද්ධ ලැබීම, 2024 වසරේ ජනවාරි-මැයි කාලපරිච්ඡේදය තුළ ප්‍රාථමික වෙළෙඳපොළ වෙත වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 48ක ශුද්ධ ලැබීම සහ ද්විතීයික වෙළෙඳපොළ වෙතින් වූ එ.ජ. ඩොලර් මිලියන 25ක ශුද්ධ ගෙවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

## ජාත්‍යන්තර සංචිත

දළ නිල සංචිත 2023 වසර අවසානයට සාපේක්ෂව එ.ජ. ඩොලර් බිලියන 1කට වඩා වැඩිවීමක් වාර්තා කරමින් 2024 වසරේ මැයි මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 5.4ක් විය. චීන මහජන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් බිලියන 1.5කට පමණ සමාන විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වූ අතර, එය භාවිතා කිරීමේ දී ඇතැම් කොන්දේසිවලට යටත් වේ. 2023 වසර අවසානයේ සිට දළ නිල සංචිත ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළෙන් සැලකිය යුතු ලෙස විදේශ විනිමය මිලදී ගැනීමයි. 2024 වසරේ මැයි මාසයේ ශුද්ධ මිලදී ගැනීම් එ.ජ. ඩොලර් මිලියන 193ක් වූ අතර (වෙළෙඳ දිනය මත පදනම්ව) 2024 වසරේ පළමු මාස පහ තුළ ශුද්ධ මිලදී ගැනීම් එ.ජ. ඩොලර් බිලියන 1.8ක් ලෙස සටහන් විය. කෙසේ වෙතත්, 2024 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2024 වසරේ මැයි මස අවසානයේ දී දළ නිල සංචිතහි සුළු අඩුවීමක් ඇති කරමින්, රජය සහ මහ බැංකුව විසින් කැපී පෙනෙන ණය සේවාකරණ ගෙවීම් සිදු කරන ලදී. මේ අතර, දළ නිල සංචිත (චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ඇතුළත්ව) මගින් ආවරණය කළ හැකි ආනයන ප්‍රමාණය, 2024 වසරේ මැයි මස අවසන් වන විට එය ආනයනික මාස 3.8ක් විය.

**රූප සටහන 13: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයෙහි හැසිරීම

2024 වසරේ මේ දක්වා සමස්තයක් වශයෙන් අතිප්‍රමාණය වුවද, ශ්‍රී ලංකා රුපියල 2024 වසරේ ජූනි මස තුළ දී අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. 2024 වසරේ ජූනි මස 28 දක්වා වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 6.0කින් අතිප්‍රමාණය විය. කෙසේ වෙතත්, මැයි සහ ජූනි මාසවල දී රුපියල පිළිවෙළින් සියයට 1.7කින් සහ සියයට 1.2කින් අවප්‍රමාණය වී ඇත. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2024 වසරේ ජූනි මස 28 දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යුරෝ, ස්ටර්ලින් පවුම, චීන යුවාන්, ජපන් යෙන්, ඉන්දියානු රුපියල, සහ ඕස්ට්‍රේලියානු ඩොලරය වැනි අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය. රුපියලෙහි වූ නාමික අතිප්‍රමාණයට අනුකූලව 2024 වසරේ මැයි මස දක්වා වසර තුළ දී මුදල් වර්ග 24කින් සැදුම් ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) අතිප්‍රමාණය විය. ඒ අනුව, 2024 වසරේ මේ දක්වා විදේශීය තරඟකාරීත්වයෙහි අඩු වීමක් පිළිඹිබු කරමින්, මූ.ස.වි.අ. 24හි දර්ශකය 2023 වසරේ දෙසැම්බර් මස අවසාන වන විට පැවති 70.2ක සිට 2024 වසරේ මැයි මස අවසාන වන විට 75.5ක් දක්වා ඉහළ ගියේය.

**රූප සටහන 14: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වෙනස් වීම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 15: විනිමය අනුපාතිකයෙහි සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකයෙහි වෙනස් වීම (2024 ජනවාරි 01 – 2024 මැයි 31)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 1: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස් වීම***

| මුදල් ඒකකය | 2022 | 2023 | 2024 (ජූනි 28 දක්වා) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -44.8% | +12.1% | +6.0% |
| යුරෝ | -41.4% | +7.9% | +9.7% |
| ස්ටර්ලින් පවුම | -38.1% | +6.0% | +6.8% |
| චීන යුවාන් (රෙන්මින්බි) | -39.8% | +14.3% | +8.6% |
| ජපන් යෙන් | -36.4% | +19.5% | +20.7% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -40.8% | +10.8% | +9.2% |
| ඉන්දියානු රුපියල | -38.6% | +12.6% | +6.4% |

* අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+)

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ඉදිරි දින දර්ශනයට අනුව, 2024 වසරේ ජූනි මාසය සඳහා වන විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ පුවත්පත් නිවේදනය 2024 වසරේ ජූලි මස 31 වන දින නිකුත් කරනු ඇත.**

ඇමුණුම I :

### වෙළඳ අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශය (අ)

| කාණ්ඩය | මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන. - මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන. - මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩ අපනයන | 1,019.5 | 1,011.3 | -0.8 | 4,865.7 | 5,067.4 | 4.1 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,466.3 | 1,404.6 | -4.2 | 6,791.4 | 7,237.7 | 6.6 |
| වෙළඳ ශේෂය | -446.8 | -393.3 | | -1,925.7 | -2,170.4 | |
| සේවා ගිණුමේ ශේෂය (ශුද්ධ) | 168.6 | 230.3 | 36.6 | 1,122.7 | 1,610.4 | 43.4 |
| සේවා අංශයට වූ ලැබීම් | 365.0 | 460.1 | 26.0 | 2,066.3 | 2,873.8 | 39.1 |
| *ඒවායින්,* | | | | | | |
| සංචාරක ඉපැයීම් | 100.0 (ආ) | 154.0 (ඇ) | 54.0 | 752.1 (ආ) | 1,405.6 (ඇ) | 86.9 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 56.2 | 64.6 | 15.0 | 314.6 | 324.2 | 3.0 |
| මුහුදු ප්‍රවාහනය | 56.2 | 91.7 | 63.0 | 324.9 | 415.5 | 27.9 |
| ගුවන් ප්‍රවාහනය | 60.5 | 62.7 | 3.7 | 312.4 | 280.0 | -10.4 |
| සේවා අංශයේ ගෙවීම් | 196.4 | 229.8 | 17.0 | 943.5 | 1,263.4 | 33.9 |
| *ඒවායින්,* | | | | | | |
| විදේශ සංචාර | 33.0 | 54.0 | 63.7 | 191.2 | 349.9 | 83.0 |
| මුහුදු ප්‍රවාහනය | 21.9 | 23.3 | 6.4 | 107.7 | 132.8 | 23.3 |
| ගුවන් ප්‍රවාහනය | 33.2 | 37.8 | 13.9 | 203.3 | 185.0 | -9.0 |
| නිෂ්පාදන සේවා | 22.4 | 20.3 | -9.3 | 81.2 | 101.3 | 24.8 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 479.7 | 544.4 | 13.5 | 2,346.9 | 2,624.4 | 11.8 |
| පුද්ගලික සංක්‍රාම සඳහා ගෙවීම් | 33.2 | 13.5 | -59.5 | 77.3 | 58.9 | -23.9 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | -0.6 | -0.6 | | 3.3 | 22.8 | |
| රාජ්‍ය සුරකුම්පත් වෙළඳපොළ වෙත වූ ශුද්ධ විදේශ විනිමය ලැබීම් | 105.5 | -46.4 | | 357.8 | -159.4 | |
| සමස්ත ශේෂය | | | | 1,597.0 | 1,364.3 | |
| ***විශේෂිත අයිතමයන්*** | | | | | | |
| සංචාරක පැමිණීම් | 83,309 | 112,128 | | 524,486 | 896,779 | |
| විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් | 26,694 | 27,246 | | 122,732 | 123,041 | |

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 2023 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව
(ඇ) 2024 වසරේ දී සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වනු ලැබූ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව
(ඈ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත්ව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

ඇමුණුම II:

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.- මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **789.7** | **796.7** | **0.9** | **3,825.2** | **4,006.8** | **4.7** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 47.8 | 54.6 | 14.4 | 208.6 | 260.9 | 25.1 |
| සත්ත්ව ආහාර | 21.2 | 12.6 | -40.5 | 68.8 | 59.9 | -12.9 |
| රෙදිපිළි හා ඇඟලුම් | 413.9 | 390.9 | -5.5 | 2,030.6 | 1,961.0 | -3.4 |
| එයින්, ඇඟලුම් | 374.6 | 359.5 | -4.0 | 1,843.3 | 1,797.2 | -2.5 |
| රෙදිපිළි | 30.4 | 23.2 | -23.7 | 144.6 | 117.5 | -18.7 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 8.9 | 8.3 | -7.4 | 42.7 | 46.2 | 8.1 |
| රබර් නිෂ්පාදිත | 74.4 | 79.3 | 6.6 | 360.5 | 406.2 | 12.7 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 43.9 | 40.2 | -8.4 | 216.4 | 182.9 | -15.5 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 55.9 | 38.9 | -30.4 | 264.7 | 207.0 | -21.8 |
| ප්‍රවාහන උපකරණ | 6.1 | 5.2 | -14.1 | 44.4 | 37.7 | -15.1 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 39.1 | 90.6 | 131.6 | 207.8 | 460.4 | 121.5 |
| රසායනික නිෂ්පාදිත | 18.9 | 18.5 | -2.5 | 80.4 | 91.2 | 13.5 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 10.3 | 12.8 | 24.4 | 49.1 | 52.5 | 6.9 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.1 | 4.7 | 119.3 | 26.4 | 19.3 | -26.8 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 6.2 | 4.1 | -34.1 | 27.9 | 23.8 | -14.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 4.1 | 4.3 | 5.0 | 23.2 | 22.2 | -4.0 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 15.3 | 12.6 | -17.9 | 72.1 | 75.9 | 5.2 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.9 | 2.6 | -9.4 | 13.4 | 11.6 | -13.2 |
| වෙනත් කාර්මික අපනයන | 27.5 | 24.7 | -10.1 | 131.0 | 134.3 | 2.5 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **225.7** | **210.6** | **-6.7** | **1,017.9** | **1,039.0** | **2.1** |
| තේ | 116.3 | 115.0 | -1.1 | 524.0 | 565.3 | 7.9 |
| රබර් | 2.5 | 1.9 | -22.1 | 15.4 | 10.1 | -34.8 |
| පොල් | 31.4 | 32.6 | 3.7 | 132.6 | 158.2 | 19.3 |
| කුළුබඩු | 27.0 | 25.1 | -6.9 | 148.2 | 109.8 | -25.9 |
| එළවළු | 2.6 | 2.2 | -15.7 | 11.8 | 11.4 | -3.0 |
| සකස් නොකළ දුම්කොළ | 2.1 | 2.7 | 29.6 | 11.0 | 9.7 | -12.0 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 20.8 | 13.6 | -34.5 | 60.5 | 66.5 | 10.1 |
| මුහුදු ආහාර | 23.0 | 17.4 | -24.3 | 114.5 | 108.1 | -5.6 |
| **3. ඛනිජ අපනයන** | **1.7** | **1.8** | **7.0** | **10.8** | **10.2** | **-5.6** |
| **4. වර්ග නොකළ අපනයන** | **2.5** | **2.2** | **-13.7** | **11.7** | **11.3** | **-3.6** |
| **මුළු අපනයන** | **1,019.5** | **1,011.3** | **-0.8** | **4,865.7** | **5,067.4** | **4.1** |

(අ) තාවකාලික.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම III:

සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව අපනයන සංයුතිය (අ)

| කාණ්ඩය | මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.- මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **249.0** | **232.7** | **-6.5** | **1,090.4** | **1,136.6** | **4.2** |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 26.2 | 21.2 | -19.1 | 130.2 | 127.5 | -2.1 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 5.0 | 5.8 | 15.3 | 27.7 | 30.7 | 10.6 |
| 05 එළවළු හා පලතුරු | 43.9 | 40.0 | -8.7 | 156.4 | 187.7 | 20.0 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 143.3 | 139.3 | -2.8 | 671.3 | 677.2 | 0.9 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **15.1** | **14.6** | **-3.4** | **67.8** | **68.9** | **1.6** |
| 11 පාන වර්ග | 6.0 | 6.6 | 9.2 | 29.4 | 33.5 | 13.9 |
| 12 දුම්කොළ හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදිත | 9.0 | 8.0 | -11.8 | 38.4 | 35.4 | -7.8 |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **32.1** | **32.9** | **2.5** | **161.2** | **160.9** | **-0.2** |
| 23 සකස් නොකළ රබර් | 2.6 | 2.0 | -20.7 | 15.9 | 10.7 | -32.9 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 19.9 | 19.1 | -3.9 | 91.7 | 93.8 | 2.2 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **39.1** | **90.6** | **131.6** | **207.8** | **460.4** | **121.5** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 39.1 | 66.5 | 70.0 | 207.8 | 426.1 | 105.0 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | - | 24.1 | - | - | 34.3 | - |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **6.2** | **5.6** | **-10.0** | **26.1** | **30.8** | **17.7** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 6.2 | 5.5 | -10.6 | 25.8 | 29.4 | 13.9 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **22.4** | **21.8** | **-2.5** | **97.2** | **109.1** | **12.3** |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **165.4** | **154.0** | **-6.9** | **775.3** | **771.4** | **-0.5** |
| 62 රබර් නිෂ්පාදන (අන් තැනක සඳහන් නොවන) | 56.8 | 60.3 | 6.1 | 268.8 | 307.0 | 14.2 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 36.0 | 29.5 | -18.0 | 167.4 | 155.9 | -6.9 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 50.7 | 44.2 | -12.8 | 241.1 | 205.1 | -14.9 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **60.3** | **43.0** | **-28.6** | **300.9** | **239.4** | **-20.4** |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් (අන් තැනක සඳහන් නොවන) | 31.8 | 22.0 | -30.9 | 159.3 | 116.1 | -27.2 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **429.9** | **416.0** | **-3.2** | **2,138.9** | **2,089.8** | **-2.3** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 396.3 | 380.8 | -3.9 | 1,951.6 | 1,910.6 | -2.1 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **0.1** | **0.03** | **-65.3** | **0.2** | **0.1** | **-5.6** |
| **මුළු අපනයන** | **1,019.5** | **1,011.3** | **-0.8** | **4,865.7** | **5,067.4** | **4.1** |

(අ) තාවකාලික.

…සැලකිය යුතු නොවේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017 හි විශේෂ සටහන 04 බලන්න.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

ඇමුණුම IV:

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්ගීකරණයට අනුව වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)**

| කාණ්ඩය | මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.- මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **292.9** | **228.9** | **-21.8** | **1,241.7** | **1,287.4** | **3.7** |
| ආහාර හා පාන වර්ග | 198.7 | 123.7 | -37.7 | 698.7 | 700.9 | 0.3 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 8.9 | 5.7 | -36.6 | 49.1 | 52.5 | 7.0 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 44.2 | 12.7 | -71.1 | 112.7 | 86.0 | -23.7 |
| එළවළු (ආ) | 39.2 | 39.0 | -0.6 | 139.3 | 186.0 | 33.5 |
| මුහුදු ආහාර | 6.0 | 9.8 | 63.8 | 19.6 | 48.8 | 149.3 |
| සීනි හා රසකැවිලි | 59.8 | 21.1 | -64.8 | 220.5 | 126.6 | -42.6 |
| කුළුබඩු | 14.4 | 10.0 | -30.7 | 54.2 | 48.7 | -10.2 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 26.1 | 25.4 | -2.9 | 103.3 | 152.4 | 47.5 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 94.2 | 105.2 | 11.7 | 543.1 | 586.5 | 8.0 |
| පෞද්ගලික රථවාහන | 1.1 | 5.4 | 381.4 | 12.5 | 22.9 | 82.8 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 47.9 | 39.5 | -17.6 | 306.4 | 226.1 | -26.2 |
| ගෘහ උපකරණ | 3.8 | 10.7 | 179.3 | 19.7 | 59.9 | 203.5 |
| රෙදිපිළි හා උපාංග | 13.7 | 13.9 | 1.5 | 71.2 | 84.3 | 18.4 |
| විදුලි සංදේශ උපකරණ | 6.6 | 4.5 | -31.6 | 23.6 | 50.2 | 113.1 |
| ගෘහ හා දැව භාණ්ඩ | 7.9 | 11.7 | 48.9 | 38.5 | 51.1 | 32.7 |
| වෙනත් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 13.3 | 19.6 | 47.4 | 71.1 | 91.9 | 29.4 |
| **2. අන්තර් භාණ්ඩ** | **970.5** | **928.3** | **-4.3** | **4,571.1** | **4,706.9** | **3.0** |
| ඉන්ධන | 429.8 | 314.0 | -26.9 | 2,064.8 | 1,843.7 | -10.7 |
| එයින්, බොරතෙල් | 180.8 | 64.9 | -64.1 | 493.3 | 438.0 | -11.2 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 223.6 | 219.6 | -1.8 | 1,232.9 | 1,235.5 | 0.2 |
| ගල්අඟුරු | 25.4 | 29.5 | 16.3 | 338.7 | 170.3 | -49.7 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග | 27.8 | 29.0 | 4.6 | 110.7 | 106.2 | -4.1 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 212.7 | 227.3 | 6.9 | 999.9 | 1,094.2 | 9.4 |
| කඩදාසි හා ඝන කඩදාසි | 33.7 | 35.3 | 4.8 | 173.3 | 175.3 | 1.2 |
| කෘෂිකාර්මික යෙදවුම් | 20.0 | 23.2 | 15.9 | 106.6 | 103.4 | -3.0 |
| තිරිඟු හා ඉරිඟු | 32.6 | 49.4 | 51.5 | 146.9 | 123.0 | -16.2 |
| මූල ලෝහ | 27.5 | 28.0 | 2.0 | 91.2 | 193.8 | 112.6 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 39.1 | 49.4 | 26.5 | 180.0 | 226.0 | 25.6 |
| රසායනික නිෂ්පාදිත | 70.6 | 76.1 | 7.7 | 321.4 | 396.1 | 23.2 |
| පොහොර | 11.5 | 18.0 | 57.0 | 61.6 | 41.9 | -32.0 |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 15.6 | 20.8 | 33.0 | 68.4 | 109.1 | 59.4 |
| ඛනිජ නිෂ්පාදිත | 4.3 | 10.1 | 137.1 | 28.6 | 48.8 | 70.5 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 45.4 | 47.6 | 4.9 | 217.5 | 245.2 | 12.7 |
| **3. ආයෝජන භාණ්ඩ** | **201.5** | **247.2** | **22.7** | **971.3** | **1,238.6** | **27.5** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 132.0 | 166.7 | 26.3 | 658.8 | 833.0 | 26.4 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 65.4 | 69.9 | 7.0 | 280.7 | 353.7 | 26.0 |
| ප්‍රවාහන උපකරණ | 4.0 | 10.4 | 157.8 | 30.8 | 50.9 | 65.3 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.1 | 0.2 | 142.2 | 1.1 | 1.0 | -11.7 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.4** | **0.2** | **-87.0** | **7.3** | **4.9** | **-32.4** |
| **මුළු ආනයන** | **1,466.3** | **1,404.6** | **-4.2** | **6,791.4** | **7,237.7** | **6.6** |
| **එයින් ඉන්ධන නොවන ආනයන** | **1,036.5** | **1,090.6** | **5.2** | **4,726.6** | **5,394.0** | **14.1** |

(අ) තාවකාලික.
(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම V:

සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයට (සිව්වන සංස්කරණය) අනුව ආනයන සංයුතිය (අ)

| කාණ්ඩය | මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.- මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.- මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **0. ආහාර හා සජීවී සතුන්** | **240.0** | **190.7** | **-20.6** | **928.5** | **884.6** | **-4.7** |
| 02 කිරි ආශ්‍රිත නිෂ්පාදිත හා කුරුලු බිත්තර | 45.2 | 12.8 | -71.8 | 114.1 | 92.1 | -19.3 |
| 03 මත්ස්‍යයින් හා ඒ ආශ්‍රිත සැකසුම් | 6.1 | 10.1 | 64.3 | 20.1 | 49.4 | 146.1 |
| 04 ධාන්‍ය හා ධාන්‍ය සැකසුම් | 41.3 | 54.7 | 32.2 | 195.7 | 174.3 | -10.9 |
| 05 එළවළු හා පලතුරු | 42.3 | 44.0 | 4.0 | 157.7 | 215.8 | 36.9 |
| 06 සීනි, සීනි ආශ්‍රිත සැකසුම් හා පැණි | 59.8 | 21.1 | -64.8 | 220.5 | 126.6 | -42.6 |
| 07 කෝපි, තේ, කොකෝවා, කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 18.4 | 15.1 | -17.6 | 72.1 | 72.0 | -0.2 |
| **1. පාන වර්ග හා දුම්කොළ** | **9.8** | **7.7** | **-21.7** | **48.8** | **41.7** | **-14.6** |
| **2. ඉන්ධන හැර ආහාරයට නුසුදුසු සකස් නොකළ ද්‍රව්‍ය** | **28.7** | **37.3** | **29.9** | **120.1** | **165.7** | **37.9** |
| 23 සකස් නොකළ රබර් | 11.2 | 17.3 | 54.2 | 50.1 | 89.5 | 78.6 |
| 26 රෙදිපිළි සඳහා යොදාගනු ලබන කෙඳි වර්ග හා ඒවායේ අපද්‍රව්‍ය | 6.0 | 0.8 | -87.5 | 19.8 | 7.0 | -64.4 |
| **3. ඛනිජමය ඉන්ධන, ලිහිසි ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය** | **429.8** | **314.0** | **-26.9** | **2,064.8** | **1,843.7** | **-10.7** |
| 33 ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත හා ඒ ආශ්‍රිත ද්‍රව්‍ය | 387.3 | 260.9 | -32.6 | 1,613.9 | 1,535.4 | -4.9 |
| 34 ස්වාභාවික හා නිෂ්පාදිත ගෑස් වර්ග | 17.1 | 23.6 | 38.2 | 112.2 | 138.1 | 23.0 |
| **4. සත්ත්ව හා එළවළු තෙල්, මේද හා ඉටි** | **18.6** | **13.5** | **-27.7** | **56.3** | **82.9** | **47.2** |
| 42 පිරිපහදු කළ හෝ නොකළ, නිස්සාරණයට ලක් කළ ස්ථායී එළවළු මේද හා තෙල් | 17.7 | 12.6 | -28.9 | 52.5 | 77.1 | 46.8 |
| **5. රසායනික ද්‍රව්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන)** | **164.3** | **180.5** | **9.8** | **847.6** | **873.7** | **3.1** |
| 54 බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 44.2 | 35.8 | -19.1 | 287.1 | 206.2 | -28.2 |
| 56 පොහොර | 11.5 | 18.0 | 56.4 | 61.5 | 41.4 | -32.7 |
| 57 ප්‍රාථමික ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 25.3 | 35.3 | 39.1 | 113.7 | 153.3 | 34.8 |
| 58 ප්‍රාථමික නොවන ස්වරූපයෙන් පවතින ප්ලාස්ටික් | 10.6 | 10.4 | -1.5 | 51.1 | 54.6 | 7.0 |
| **6. ප්‍රධාන වශයෙන්ම ද්‍රව්‍ය අනුව වර්ග කර ඇති නිෂ්පාදන භාණ්ඩ** | **371.3** | **400.2** | **7.8** | **1,690.1** | **1,992.7** | **17.9** |
| 64 කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 33.1 | 34.1 | 3.2 | 167.6 | 167.3 | -0.2 |
| 65 රෙදිපිළි සඳහා යොදාගනු ලබන නූල්, රෙදි, සකස් කරන ලද උපාංග, හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 204.5 | 223.8 | 9.4 | 965.0 | 1,070.1 | 10.9 |
| 66 ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවන) | 44.6 | 49.4 | 10.7 | 195.6 | 221.4 | 13.2 |
| 67 යකඩ හා වානේ | 38.9 | 37.7 | -3.1 | 124.0 | 253.8 | 104.6 |
| **7. යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහන උපකරණ** | **145.8** | **198.8** | **36.4** | **741.6** | **1,023.3** | **38.0** |
| 72 ඇතැම් කර්මාන්ත සඳහා විශේෂයෙන් සකස් කරන ලද යන්ත්‍රසූත්‍ර | 20.1 | 29.9 | 48.4 | 92.5 | 143.3 | 54.9 |
| 74 සාමාන්‍ය කාර්මික යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ යන්ත්‍ර කොටස් (අන් තැනක සඳහන් නොවන) | 25.8 | 37.8 | 46.5 | 133.5 | 216.0 | 61.7 |
| 75 කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර හා ස්වයංක්‍රීය දත්ත සැකසුම් යන්ත්‍ර | 8.1 | 10.4 | 28.8 | 51.0 | 68.9 | 34.9 |
| 76 විදුලි සන්දේශ සහ ශබ්ද පටිගත කිරීම හා ප්‍රතිනිෂ්පාදන කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ | 21.3 | 20.9 | -2.1 | 78.7 | 141.8 | 80.3 |
| 77 විද්‍යුත් යන්ත්‍රසූත්‍ර, උපකරණ හා උපාංග (අන් තැනක සඳහන් නොවන) සහ ඒ ආශ්‍රිත විද්‍යුත් කොටස් | 46.1 | 47.7 | 3.5 | 223.3 | 225.9 | 1.2 |
| 78 රථවාහන | 10.4 | 16.9 | 61.9 | 57.5 | 79.5 | 38.4 |
| **8. විවිධ නිෂ්පාදන උපාංග** | **56.4** | **61.6** | **9.3** | **286.9** | **326.6** | **13.8** |
| 84 නිමි ඇඳුම් හා ඇඟලුම් සකස් කිරීමට ගන්නා උපාංග | 11.6 | 11.8 | 2.0 | 64.1 | 74.2 | 15.8 |
| 87 වෘත්තිමය, විද්‍යාත්මක හා පාලන මෙවලම් සහ උපකරණ (අන් තැනක සඳහන් නොවන) | 12.1 | 9.6 | -20.7 | 57.5 | 59.5 | 3.4 |
| **9. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි වෙනත් ස්ථානයක සඳහන් නොවන වෙළඳ භාණ්ඩ හා ගනුදෙනු** | **1.4** | **0.2** | **-84.0** | **6.6** | **3.0** | **-54.1** |
| **මුළු ආනයන** | **1,466.3** | **1,404.4** | **-4.2** | **6,791.4** | **7,237.7** | **6.6** |

(අ) තාවකාලික.

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණයෙහි පළමු අංකයෙන් අංශය ද පළමු අංක දෙකෙන් කාණ්ඩය ද දැක්වේ. තෝරා ගත් කාණ්ඩ පමණක් ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. සම්මත ජාත්‍යන්තර වෙළඳ වර්ගීකරණය පිළිබඳ තවදුරටත් දැන ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017හි විශේෂ සටහන 04 බලන්න.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2017/si/9_Chapter_05.pdf

ඇමුණුම VI:

## සේවා ගිණුම - ලැබීම් (අ)

| | මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.-මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **සේවා** | **365.0** | **460.1** | **26.0** | **2,066.3** | **2,873.8** | **39.1** |
| **නිෂ්පාදන සේවා** | **1.3** | **0.8** | **-33.3** | **7.8** | **15.5** | **98.7** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා** | **3.1** | **5.4** | **75.3** | **16.7** | **15.4** | **-7.4** |
| **ප්‍රවාහනය** | **116.8** | **154.6** | **32.4** | **637.4** | **696.5** | **9.3** |
| මුහුදු ප්‍රවාහනය | 56.2 | 91.7 | 63.0 | 324.9 | 415.5 | 27.9 |
| මගී ගාස්තු | 0.006 | 0.2 | | 0.05 | 1.0 | |
| නැව් කුලී | 39.6 | 50.9 | 28.5 | 164.4 | 250.3 | 52.3 |
| වෙනත් | 16.6 | 40.6 | 144.2 | 160.5 | 164.2 | 2.3 |
| ගුවන් ප්‍රවාහනය | 60.5 | 62.7 | 3.7 | 312.4 | 280.0 | -10.4 |
| මගී ගාස්තු | 21.1 | 19.5 | -7.3 | 127.7 | 122.4 | -4.2 |
| ගුවන් කුලී | 11.1 | 6.9 | -37.8 | 37.3 | 23.1 | -38.0 |
| වෙනත් | 28.3 | 36.3 | 28.2 | 147.4 | 134.5 | -8.8 |
| තැපැල් සේවා | 0.04 | 0.15 | 292.1 | 0.09 | 1.0 | |
| **සංචාරක** | **100.0** | **154.0** | **54.0** | **752.1** | **1,405.6** | **86.9** |
| **ඉදිකිරීම්** | **30.2** | **20.7** | **-31.4** | **103.4** | **101.1** | **-2.3** |
| විදේශයන්හි ඉදිකිරීම් | 3.1 | 0.7 | -78.2 | 11.8 | 12.6 | 7.0 |
| දේශීය ඉදිකිරීම් | 18.1 | 6.6 | -63.3 | 49.3 | 42.7 | -13.4 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 9.0 | 13.4 | 49.2 | 42.4 | 45.8 | 8.0 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **2.7** | **1.6** | **-41.8** | **13.6** | **10.1** | **-25.9** |
| සෘජු රක්ෂණය | 2.5 | 1.5 | -40.4 | 13.1 | 7.8 | -40.4 |
| ප්‍රතිරක්ෂණය | 0.2 | 0.1 | -63.0 | 0.5 | 2.2 | 379.5 |
| **මූල්‍ය සේවා** | **4.0** | **7.0** | **73.4** | **27.4** | **31.0** | **13.0** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු** | **0.4** | **0.9** | **148.5** | **4.8** | **4.1** | **-13.8** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **75.4** | **72.0** | **-4.5** | **374.9** | **394.1** | **5.1** |
| විදුලි සංදේශ සේවා | 19.2 | 7.4 | -61.6 | 60.3 | 69.9 | 15.9 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 56.2 | 64.6 | 15.0 | 314.6 | 324.2 | 3.0 |
| පරිගණක සේවා | 55.4 | 64.0 | 15.5 | 311.0 | 321.6 | 3.4 |
| තොරතුරු සේවා | 0.8 | 0.6 | -22.3 | 3.7 | 2.6 | -28.9 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **28.4** | **36.3** | **27.9** | **110.9** | **184.0** | **65.9** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | 2.7 | 3.8 | 38.4 | 8.0 | 17.9 | 122.8 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 12.8 | 12.3 | -3.8 | 36.2 | 67.2 | 85.5 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | 12.8 | 20.2 | 57.4 | 66.6 | 98.9 | 48.4 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **2.8** | **2.2** | **-19.5** | **14.6** | **10.2** | **-29.9** |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | 0.4 | 0.7 | 51.3 | 0.7 | 2.8 | 292.5 |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 2.3 | 1.6 | -33.0 | 13.9 | 7.4 | -46.5 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම්** | **0.1** | **4.6** | | **2.6** | **6.3** | **145.8** |

(අ) තාවකාලික. සංචාරක ඉපැයීම් හැර අනෙකුත් සියලුම දත්ත අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම් වේ. සංචාරක ඉපැයීම් දත්ත, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කරන ලද සමීක්ෂණය මත පදනම් වේ.

**මූලයන්:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ඇමුණුම VII:

## සේවා ගිණුම - ගෙවීම් (අ)

| | මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.-මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **සේවා** | **196.4** | **229.8** | **17.0** | **943.5** | **1,263.4** | **33.9** |
| **නිෂ්පාදන සේවා** | **22.4** | **20.3** | **-9.3** | **81.2** | **101.3** | **24.8** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා** | **0.8** | **0.8** | **-3.7** | **2.1** | **4.5** | **118.5** |
| **ප්‍රවාහනය** | **55.1** | **61.1** | **11.0** | **311.7** | **320.5** | **2.8** |
| මුහුදු ප්‍රවාහනය | 21.9 | 23.3 | 6.4 | 107.7 | 132.8 | 23.3 |
| මගී ගාස්තු | 0.0 | 0.016 | -56.9 | 0.8 | 0.3 | -65.3 |
| නැව් කුලී | 17.6 | 22.4 | 27.1 | 90.5 | 127.1 | 40.4 |
| වෙනත් | 4.3 | 0.9 | -78.4 | 16.5 | 5.5 | -66.8 |
| ගුවන් ප්‍රවාහනය | 33.2 | 37.8 | 13.9 | 203.3 | 185.0 | -9.0 |
| මගී ගාස්තු | 18.3 | 23.0 | 25.5 | 112.4 | 114.4 | 1.8 |
| ගුවන් කුලී | 8.4 | 6.7 | -20.6 | 39.9 | 25.0 | -37.5 |
| වෙනත් | 6.5 | 8.1 | 25.9 | 50.9 | 45.7 | -10.3 |
| තැපැල් සේවා | 0.0 | 0.0 | | 0.7 | 2.6 | 252.8 |
| **සංචාරක** | **33.0** | **54.0** | **63.7** | **191.2** | **349.9** | **83.0** |
| **ඉදිකිරීම්** | **3.4** | **6.7** | **95.9** | **47.2** | **43.1** | **-8.7** |
| විදේශයන්හි ඉදිකිරීම් | 0.00 | 0.7 | | 1.1 | 9.7 | |
| දේශීය ඉදිකිරීම් | 0.1 | 2.1 | | 30.1 | 6.2 | -79.4 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 3.3 | 4.0 | 20.5 | 16.0 | 27.2 | 69.8 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **4.4** | **5.0** | **13.8** | **15.8** | **24.9** | **57.3** |
| සෘජු රක්ෂණය | 0.7 | 0.7 | 2.7 | 2.9 | 5.3 | 84.4 |
| ප්‍රතිරක්ෂණය | 3.7 | 4.3 | 15.9 | 12.9 | 19.5 | 51.2 |
| **මූල්‍ය සේවා** | **3.6** | **5.1** | **42.1** | **22.6** | **40.5** | **79.3** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු** | **12.8** | **13.7** | **6.6** | **26.8** | **51.9** | **94.0** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **22.4** | **23.6** | **5.2** | **102.2** | **95.4** | **-6.6** |
| විදුලි සංදේශ සේවා | 2.5 | 3.7 | 51.4 | 14.2 | 16.9 | 18.7 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 20.0 | 19.9 | -0.5 | 87.9 | 78.5 | -10.7 |
| පරිගණක සේවා | 9.9 | 17.3 | 74.3 | 58.6 | 66.2 | 12.9 |
| තොරතුරු සේවා | 10.0 | 2.6 | -74.4 | 29.3 | 12.3 | -57.9 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **34.8** | **38.0** | **9.2** | **132.8** | **223.2** | **68.1** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | 6.7 | 6.9 | 2.9 | 29.9 | 37.2 | 24.4 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 12.5 | 14.7 | 17.4 | 45.5 | 83.4 | 83.3 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | 15.6 | 16.4 | 5.2 | 57.5 | 102.7 | 78.7 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **1.51** | **1.4** | **-4.1** | **5.7** | **7.0** | **21.9** |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | 0.1 | 1.4 | | 3.78 | 6.7 | 77.7 |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 1.4 | 0.1 | -96.1 | 2.0 | 0.3 | -85.4 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම්** | **2.26** | **0.2** | **-92.0** | **4.3** | **1.1** | **-73.2** |

(අ) තාවකාලික

**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම VIII:

## සේවා ගිණුම - ශුද්ධ (අ)

| | මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-මැයි 2023 (එ.ජ.ඩො. මිලියන) | ජන.-මැයි 2024 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **සේවා** | **168.6** | **230.3** | **36.6** | **1,122.7** | **1,610.4** | **43.4** |
| **නිෂ්පාදන සේවා** | **-21.1** | **-19.4** | **-7.9** | **-73.4** | **-85.8** | **17.0** |
| **නඩත්තු සහ අලුත්වැඩියා සේවා** | **2.3** | **4.7** | **101.8** | **14.6** | **10.9** | **-25.2** |
| **ප්‍රවාහනය** | **61.7** | **93.4** | **51.5** | **325.7** | **376.1** | **15.5** |
| මුහුදු ප්‍රවාහනය | 34.3 | 68.4 | 99.1 | 217.2 | 282.7 | 30.1 |
| මගී ගාස්තු | 0.0 | 0.2 | | -0.7 | 0.8 | -208.7 |
| නැව් කුලී | 22.0 | 28.5 | 29.6 | 73.9 | 123.2 | 66.8 |
| වෙනත් | 12.4 | 39.7 | 220.9 | 144.0 | 158.7 | 10.2 |
| ගුවන් ප්‍රවාහනය | 27.3 | 24.9 | -8.7 | 109.2 | 95.0 | -13.0 |
| මගී ගාස්තු | 2.7 | -3.5 | -228.2 | 15.3 | 8.0 | -47.8 |
| ගුවන් කුලී | 2.71 | 0.2 | -90.9 | -2.7 | -1.9 | -30.9 |
| වෙනත් | 21.8 | 28.2 | 28.9 | 96.6 | 88.9 | -8.0 |
| තැපැල් සේවා | 0.04 | 0.1 | 223.0 | -0.6 | -1.6 | 144.8 |
| **සංචාරක** | **67.0** | **100.0** | **49.2** | **560.9** | **1,055.6** | **88.2** |
| **ඉදිකිරීම්** | **26.8** | **14.0** | **-47.7** | **56.3** | **58.0** | **3.1** |
| විදේශයන්හි ඉදිකිරීම් | 3.1 | 0.0 | -99.5 | 10.7 | 2.9 | -72.7 |
| දේශීය ඉදිකිරීම් | 18.0 | 4.6 | -74.5 | 19.2 | 36.5 | 90.2 |
| ගෘහ නිර්මාණ, ඉංජිනේරු සහ අනෙකුත් තාක්ෂණික සේවා | 5.7 | 9.4 | 65.9 | 26.4 | 18.6 | -29.4 |
| **රක්ෂණ හා විශ්‍රාම වැටුප්** | **-1.7** | **-3.4** | **103.2** | **-2.2** | **-14.8** | |
| සෘජු රක්ෂණය | 1.8 | 0.8 | -56.5 | 10.2 | 2.5 | -75.7 |
| ප්‍රතිරක්ෂණය | -3.5 | -4.2 | 19.7 | -12.5 | -17.3 | 38.9 |
| **මූල්‍ය සේවා** | **0.5** | **1.9** | **311.5** | **4.8** | **-9.6** | **-299.9** |
| **බුද්ධිමය දේපල භාවිතය සඳහා ගාස්තු** | **-12.4** | **-12.8** | **2.6** | **-22.0** | **-47.8** | **117.5** |
| **විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා** | **52.9** | **48.4** | **-8.6** | **272.8** | **298.6** | **9.5** |
| විදුලි සංදේශ සේවා | 16.7 | 3.6 | -78.2 | 46.1 | 53.0 | 15.0 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවා | 36.2 | 44.7 | 23.5 | 226.7 | 245.7 | 8.4 |
| පරිගණක සේවා | 45.5 | 46.7 | 2.7 | 252.3 | 255.4 | 1.2 |
| තොරතුරු සේවා | -9.3 | -2.0 | -78.6 | -25.6 | -9.7 | -62.1 |
| **වෙනත් ව්‍යාපාරික සේවා** | **-6.5** | **-1.7** | **-73.1** | **-21.9** | **-39.2** | **78.9** |
| පර්යේෂණ සහ සංවර්ධන සේවා | -4.0 | -3.1 | -21.6 | -21.8 | -19.3 | -11.7 |
| වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා | 0.3 | -2.4 | | -9.2 | -16.1 | 74.7 |
| තාක්ෂණික, වෙළඳාම ආශ්‍රිත සහ වෙනත් ව්‍යාපාරික සේවා | -2.8 | 3.8 | -237.0 | 9.2 | -3.7 | -140.8 |
| **පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා** | **1.3** | **0.8** | **-38.0** | **8.8** | **3.2** | **-63.5** |
| ශ්‍රව්‍ය දෘෂ්‍ය සහ ඊට අදාළ සේවා | 0.3 | -0.7 | -309.0 | -3.1 | -3.9 | 27.6 |
| වෙනත් පුද්ගලික, සංස්කෘතික සහ විනෝදාත්මක සේවා | 0.9 | 1.5 | 64.0 | 11.9 | 7.1 | -40.1 |
| **රජයේ භාණ්ඩ හා සේවා වියදම්** | **-2.2** | **4.5** | **-305.9** | **-1.7** | **5.2** | **-399.7** |

(අ) තාවකාලික

**මූලය:** අන්තර්ජාතික ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය - ශ්‍රී ලංකා මහ බැංකුව